# නිල් පිහිනුම් කකුළුවෝ

## පුවත් හසුන අංක 5 වෙත ඔබව පිළිගනිමු

නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තය ආසියාවේ ප්‍රථම ජාත්‍යන්තරව පිලිගත් තිරසාර කලමණාකරනයකින් යුක්ත ධීවර කර්මාන්තයක් බවට පත් කිරිම සඳහා ගත වූ මාස හයක කාලය තුල ධීවර සංවර්ධන ව්‍යාපෘතිය (ෆෂඡ) විශාල කාර්යයක් කරන ලදී. තවද නිල් පිහිනුම් කකුළුවෝ ධිවර කර්මාන්තය මගින් වෙනත් මුහුදු ජිවින්ට ඇති බලපෑම, මුහුදු ජීවින්ගේ වාසස්ථාන හා සාගර පරිසර පද්ධතියට ඇති බලපෑම නිරක්ෂණය කිරීම සඳහා තවත් උප ව්‍යාපෘති රැසක් ධිවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලදී. එහිදි නිල් පිහිනුම් කකුළුවෝ ධීවර ජනතාව බලයලත් ආයතන මෙන්ම මත්ස්‍ය ආහාර නිශ්පාදකයින් විසින් අස්වැන්න පාලනය සඳහා ක්‍රියා මාර්ග ගන්නා ලදී. ඉහත දැක්වෙන කාර්යයන් පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරිමක් මෙම පුවත් හසුන මගින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

## ජීව විද්‍යාත්මක තත්වය වැඩි දියුණු කිරිම



නිල් පිහිනුම් කකුළුවන්ගේ ජිව විද්‍යාත්මක සංගහනය පිළිබඳ වාර්තාවක් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යයතනය (NARA) විසින් ධීවර සංවර්ධන ව්‍යාපෘතිය වෙත පසුගිය ජුනි මාසයේ භාරදෙන ලදී. එය නාරා ආයතනයේ පර්යේෂණ සොයාගැනීම් - ශ්‍රී ලංකාවේ ප්‍රථම නිල් පිහිනුම් කකුළුවෝ විද්‍යාත්මක සොයා ගැනිම- වන අතර එහි බෙංගාල බොක්ක ආශ්‍රිතව නිල් කකුළුවන්ගේ ප්‍රජනනය, ප්‍රථම පරිණත විමේ ප්‍රමාණය, ගැහැණු, පිරිමි අනුපාතය බිත්තර දැම්මේ කාලය කකුළුවාගේ පලල හා බර අතර අනුපාතය මෙන්ම බිත්තර දැම්මේ හැකියාව පිළිබඳ කරුණු අඩංගු වේ. එහෙත් 120පප වඩා වැඩි (වයස 1+) පරාසයේ කකුළුවන් හදුනාගැනිම අපහසු වූ නිසා ප්‍රධාන සංගහණ පරාමිතින් වන වර්ධනය හා මරණ සංඛ්‍යාව ගණනය කිරිමට නාරා ආයතනයට නොහැකි විය. 2016 වසරේ ශ්‍රී ලංකා ධිවර හා ජලජ සම්පත් සම්මේලනය ˜ඕ්ස෴* මගින් වාර්ෂිකව පවත්වනු ලබන විද්‍යාත්මක සැසිවාරයේදී ආචාර්ය සිසිර හපුතන්ත්‍රි මහතා ඇතුලු කණ්ඩායම විසින් නිල් කකුළුවන්ගේ හැඩය, ප්‍රජනන ජීව විද්‍යාව හා ආහාර ගැනිමේ පුරුදු යන ප්‍රධාන සොයා ගැනීම් පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදී.



ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ අවසන් වසර ශිෂ්‍යාවක වන අයන්තා අබේගුණවර්ධන විසින් නිල් කකුළුවන් ආශ්‍රිත විද්‍යාත්මක සොයා ගැනිමක් වන බෙංගාල බොක්ක ආශ්‍රිතව නිල් කකුළුවන්ගේ ප්‍රජනන ජීව විද්‍යාව පිළිබඳ සොයා ගැනීමක් ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ 6 වන පර්යේෂණ සමුළුවේදී ඉදිරිපත් කරන ලදි. එහිදි සොයාගත් ඉතාම වැදගත් කරුණක් වූයේ ශ්‍රී ලංකාවේ නිල් කකුළුවන්ට පරපෝෂිත බලපෑමක් (*Sacculina*) ඇති බවයි. එය ලංකාවේ ප්‍රථම සොයා ගැනිම වන අතර මෙම පර්යේෂණ කටයුතු සඳහා අයන්තා හට මග පෙන්වනු ලැබුවේ ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ සත්ව විද්‍යාව හා කෘෂි අපනයන තාක්ෂණ පීඨයේ පිඨාධිපති ආචාර්ය සේපාලිකා ජයමාන්න මහත්මිය විසිනි.

මර්ඩොක් විශ්ව විද්‍යාලයේ මත්ස්‍ය හා ධීවර පර්යේෂණ අංශයේ ආචාර්ය ඒඩ්රියන් හෝර්ඩයින් මහතා විසින් 2016 ජුනි මාසයේ barefootecologist නමින් වෙබ් අඩවියක් ආරම්භ කළ අතර එමගින් මත්ස්‍යයන්ගේ ප්‍රමාණයට සාපේක්ෂව ප්‍රජනන හැකියාව ගණනය කිරිමේ ආචාර්ය ජේරම් ප්‍රින්ස්ගේ න්‍යාය ලබා ගත හැක. ඒ අනුව මෙම න්‍යායට අනුව ධිවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් 2014/15 හා 2015/16 ලබාගත් කකුළුවන්ගේ පරිණත විමේ ප්‍රමාණය, කකුළුවන්ගේ දිග, යන දත්ත යොදා ගනිමින් කකුළුවන්ගේ ප්‍රජනන හැකියාව සහ තිරසාර ලෙස උපරිම ඇස්වැන්නක් නෙලා ගත හැකි ප්‍රමාණය ගණනය කිරිමට බලාපොරොත්තු වේ.



| වර්ෂය | ශ්‍රී ලංකාව | ධීවර ප්‍රදේශය | |
|---|---|---|---|
| | | බෙංගාල බොක්ක | ඔන්නාරම් ද්‍රෝණිය |
| *නිෂ්පාදනය* | *10ට* | *8ට* | *2ට* |
| **2015/16** | **42.2%** | **41%** | **47%** |
| **2014/15** | **31.8%** | **32%** | **31%** |

නිල් කකුළුවෝ තොගයේ ජෛව විද්‍යාත්මක තත්ත්වය වැඩි කිරිම සඳහා ධිවර සංවර්ධන ව්‍යාපෘතියට ආධාර සපයනු ලබන්නේ ජාතික ධිවර ආයතනයේ කකුළු සංගමය මගිනි

# පාරිසරික තත්වය වැඩි දියුණු කිරීම

පසුගිය මාස 6 ක කාලය තුල ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ තවත් එක් අරමුණක් වුයේ නිල් පිහිනුම් කකුළුවෝ ධිවර කර්මාන්ත ආශ්‍රිත ඉලක්ක නොකරන ලද මසුන්, මත්ස්‍ය වාසස්ථාන හා පරිසර පද්ධතින්ට ඇති පාරිසරික බලපෑම් පිළිබඳ දැනුම ලබා ගැනිමයි. ඒ අනුව ධිවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් විෂී. ඍජු ක්‍රමය උපයෝගි කරන ගනිමින් ඉලක්ක ගත නොවන මත්ස්‍යයන්ට නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තයෙන් ඇති බලපෑම් හදුනා ගන්නා ලදී.

මාර්තු මාසයේදී ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ අවසන් වසර සිසුවකු වන වත්සල දොලවත්ත, මන්නාරම වෙරළ තිරයේ නිල් කකුලුවෝ ධිවර කර්මාන්තය මගින් ඉලක්ක ගත නොකරන ලද මසුන්ට ඇති බලපෑම පිළිබඳ අධ්‍යන්‍යය කරමින් ඔහුගේ නිබන්ධය සම්පූර්ණ කරන ලදි. ඒ සඳහා මග පෙන්වන ලද්දේ සත්ව විද්‍යා හා කෘෂි අපනයන තාක්ෂණ පීඨයේ පීඨාධිපති ආචාර්ය සේපාලිකා ජයමාන්න විසිනි. තවද සාගර විශ්ව විද්‍යාලයේ, ධීවර හා සාගර විද්‍යා පීඨයේ අවසන් වසර ශිෂ්‍යාවක් වන චිරංගා මධුෂානි විසින් මැයි මාසයේදී ඉලක්ක ගත නොකළ මත්ස්‍යයන් පිළිබඳ පාරිසරික බලපෑම් තක්සේරුව පුත්තලම කලපුව ආශ්‍රිතව, කල්පිටිය, ආනවාසල ධිවර ජනතාවගේ සහයෝගයෙන් සම්පූර්ණ කරන ලදී. ඒ සඳහා ඇයට මග පෙන්වන ලද්දේ සාගර විශ්ව විද්‍යාලයේ ධිවර හා සාගර විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එම්.ෆ්.එම්. ෆයිරූස් මහතා විසිනි. එම සොයාගැනිම 2016 මැයි මස ශ්‍රී ලංකා ධිවර හා ජලජ සම්පත් සම්මේලනය (SLAFAR) මගින් පැවැත් වූ විද්‍යා සමුළුවේදි ඉදිරිපත් කරන ලදී.



ජුලි මස සිට චිරංගා ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රථම පර්යේෂණ සහායක ලෙස කටයුතු කරන අතර ඇය විසින් මන්නාරම් ප්‍රදේශයේ දෙවන හා තෙවන ඉලක්ක ගත මසුන්ට ඇති වන පාරිසර බලපෑම පිළිබඳ තක්සේරුව සිදු කිරීමට නියමිත වේ. මෙම වසර අවසානයේදී ධීවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් පාරිසරික බලපෑම් තක්සේරු 6 ක් සිදු කිරීමට නියමිත අතර එමගින් නිල් කකුළුවෝ ධිවර කර්මාන්තයෙන් ඉලක්ක ගත නොකරන මසුන්ට ඇති බලපෑම හා ධීවර කර්මාන්තයේ දීර්ඝ කාලින පැවැත්ම පිලිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත. දැනට එක් වූ දත්තවල ප්‍රාථමික විශ්ලේෂණයට අනුව දින 46 ක් තුල නිල් කකුළුවෝ ධීවර බීම් 4 ක දත්ත 476 ක් එක් රැස් කරන ලද අතර, එහි මුළු බරෙන් (8.30 tons) නිල් පිහිනුම් කකුළුවෝ බර ප්‍රතිශතය 51% කි. තවද ප්‍රයෝජනයට ගන්නා ඉලක්ක ගත නොකළ මසුන් බර ප්‍රතිශතය 39% වන අතර 10% ඉවත දමනු ලැබේ. ඉලක්ක ගත නොකල මසුන් අතර අවදානම්, තර්ජනයට ලක් වූ හා සංරක්ෂණය කළ යුතු මත්ස්‍යය වර්ග නොසිටි අතර කකුළුවෝ අස්වැන්නේ සිටි වාලක්කඩියා හෙවත් මුහුදු නයා (*Enhydrina schistosa*) සංරක්ෂණය කළ යුතු උරග, උභය ජීවි හෝ පක්ෂින් කාණ්ඩයට අයත් වේ. තවද ඉලක්ක ගත නොකල මත්ස්‍ය වර්ග 84 ක් වාර්තා වූ අතර ඒ අතරින් ජීවින් 4 ක් වැඩිදුර අධ්‍යනයට යොමු කළ යුතු වේ. එනම් මිහිරි ඉස්සා (*Pugilina cochlidium* @ 14.92%) ආප්ප මඩුවා (*Dasyatis Zugei* @ 5.58%) කට්ටි මඩුවා (*Neotrygon kuhlii* = 4.82%) අගුලුවා (*Arius* sp @ 3.35%)



නිල් කකුළුවෝ ධිවර කර්මාන්තය මගින් සාගර ජීවන්ගේ වාසස්ථාන වලට ඇති බලපෑම අධ්‍යනය කිරීම සඳහා තවත් පාරිසරික බලපෑම් තක්සේරුවක් ධිවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් 2016 අප්‍රේල් මස දී ආරම්භ කරන ලදී. ඒ අනුව කොළඹ විශ්ව විද්‍යාලයේ සත්ව විද්‍යා පීඨයේ අවසන් වසර සිදුවකු වන ජිවන්ත බණ්ඩාර විසින් ඨෂී තාක්ෂණය උපයෝගි කර ගනිමින් යාපනයේ දකුණු වෙරළ තීරයට ආසන්න මත්ස්‍ය වාසස්ථාන සිතියම් ගත කිරීම සිදු කරනු ලබයි. ඔහු ධීවරයන් සමඟ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා දත්ත සිතියම් සමඟ සමපාත කිරීමෙන් බෙංගාල බොක්ක ආශ්‍රිතව නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තයෙන් මත්ස්‍ය වාසස්ථාන වලට ඇති බලපෑම අධ්‍යනය කරනු ලබයි. මේ සඳහා විශේෂ මෘදුකාංගයක් (හැච් ඡසබාැර) කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය සඳරුවන් ඇතුලු කණ්ඩායම විසින් නිපදවනු ලැබිය.

ධිවර කර්මාන්තය ආශ්‍රිතව පාරිසරික තත්වය නගා සිටුවීම සඳහා ධිවර සංවර්ධන ව්‍යාපාතින්ට ආධාර සපයනු ලබන්නේ ජාතික ධිවර ආයතනයේ කකුළු සංගමය. ශාන්ත මොනිකා මත්ස්‍ය නිපදවන්නන්ගේ සංගමය මගිනි

# ධීවර කර්මාන්තය කළමණාකරණය කිරීම

නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තය සඳහා අස්වැන්න පාලනය කිරීමේ උපායමාර්ගයක් සකස් කිරීම ජුනි මාසයේ සිට ධීවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් ආරම්භ කරන ලදී. එම උපාය මාර්ගයන් තෝරාගත් ප්‍රමාණයේ කකුළුවන් පමණක් අල්ලා ගැනීම මත පදනම් වේ. එවැනි කළමනාකරණ උපාය මාර්ගයන් නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තය වැනි දත්ත සීමිත ධීවර කර්මාන්තය සඳහා ඉතා වැදගත් වේ.

තෝරාගත් ප්‍රමාණයක කකුළුවන් අල්ලීම මගින් ධීවර කර්මාන්තය කළමණාකරණය පහත ප්‍රධාන ලිය කියවිලි වලට අනුව සිදු වේ. එමගින් නිල් පිහිනුම් කකුළුවන්ගේ අස්වැන්න පාලනය කිරීමට බලාපොරොත්තු වන අතර ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් පනත සඳහා වැඩි අවධානය යොමු වේ. මෙම අස්වැන්න පාලනය කිරීමේ ක්‍රමවේදයන් ප්‍රායෝගික වන අතර දැනට මෙය ලංකාවේ පාලන ආයතන, නිල් පිහිනුම් කකුළුවෝ ධීවර ජනතාව හා මත්ස්‍ය ආහාර නිෂ්පාදන ආයතන මගින් පිලිපදිනු ලැබේ.

1996 අංක. 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත



නිල් පිහිනුම් කකුළුවෝ නියෝග



අස්වැන්න පාලනය කිරීමේ නිති හා ක්‍රම වේද



ධීවර කළමණාකරණ සැලසුම්



ඉදිරි මාස 3න තුලදි අස්වැන්න පාලනය කිරීමේ ක්‍රම වේදයන් පිලිබඳ වැඩිදුරටත් ධීවර ප්‍රජාව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, නාරා ආයතනය සහ නිල් පිහිනුම් කකුළුවෝ නිෂ්පාදන අයතන සමග සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ. ධීවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් මෙම සාකච්ඡා කරගෙන යාමට අනුග්‍රහය හා දායකත්වය දක්වන  අතර, එමගින් පැමිණෙන එකගතාවයන් මගින් ශ්‍රී ලංකාවේ නිල් පිහිනුම් කකුළුවෝ කළමණාකරනය, ධීවර කර්මාන්තය ආශ්‍රිතව ජෛව විවිධත්වය හා පාරිසරික තත්වය තිරසාර මට්ටමේ පවත්වා ගැනීමට උපයෝගි කර ගැනිමට බලාපොරොත්තු වේ.



නිල් පිහිනුම් කකුළුවෝ ධීවර ප්‍රජාව හා නිෂ්පාදකයින් විසින් ශ්‍රී ලංකාවේ තහනම්, බලපත්‍ර නොමැති (ෂඹඹ) ශ්‍රී ලංකා මුහුදු සීමාව තුල තමිල්නාඩු ධීවරයන් ඇතුළු විම වැලක්වීමට විශාල ශ්‍රමයක් දරනු ලබයි. මෙම තමිල්නාඩු ධීවර කර්මාන්තය ලංකාවේ දිර්ඝ කාලින ධීවර කර්මාන්තයට විශාල තර්ජනයක් වන අතර, එය උතුරේ නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තයටද බලපානු ඇත. ශ්‍රී ලංකා මත්ස්‍ය ආහාර අපනයනකරුවන්ගේ සංගමය ජනවාරි මාසයේ මේ පිළිබඳව විදේශ කටයුතු ආමාත්‍යාංශය සමග සාකච්ඡා පැවැත් වූ අතර මෙම ගැටලුව මගින් ධීවර කර්මාන්තයට ඇති බලපෑම පෙන්වා දෙන ලදි. පෙබරවාරි මාසයේ මෙම ගැටලුවට විරෝධය පල කිරීමට සඳහා 200 කට අධික උතුරේ ධීවර ප්‍රජාව හා සිවිල් සංගම රාශියක් කොළඹ නගරයට එක් රැස් විය. එදිනම සවස පැවැත්වූ සාකච්ඡාවෙන් ධීවර ප්‍රජාව මෙන්ම මීට අදාල සියලුම දෙනා පැවසුවේ අනවසර තමිල් නාඩු ධිවරයන්ගේ ඇතුල් වීමට එරෙහිව ශ්‍රී ලංකා රජය නිසි පියවර ගත යුතු බවය.

මේ පිළිබඳ එදිනෙදා විස්තර (stopindiantrawlers) නැමැති FaceBook වෙබ් අඩවිය හරහා දැක ගත හැක.

නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තය කළමණාකරණය සඳහා මූල්‍යමය ආධාර සපයන්නේ ජාතික ධීවර ආයතනයේ කකුළු කවුන්සිලය. උතුරු ඇමරිකා තායි එකමුතුව හා ආසියා පදනම මගිනි

# ආර්ථික හා සාමාජයිය සාධාරණත්වය




ජාත්‍යන්තර මුලධර්ම හා දීර්ඝ කාලින මත්ස්‍යය ආහාර නිෂ්පාදනයේදී ආර්ථික හා සාමාජීය තත්වයන් සැලකිම ඉතා අවම වේ. එම නිසා ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ සාමාජිකයන් විසින් සලකනු ලබන්නේ දීර්ඝ කාලිනව පවත්නා ධීවර කර්මාන්තයේ ප්‍රතිලාභ ධීවර ප්‍රජාව, නිෂ්පාදකයින් හා ශ්‍රී ලංකා රජය අතර සමයේ බෙදි යා යුතු බවයි. වසරේ මුල් භාගයේදි ධීවර සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිල් පිහිනුම් කකුළුවෝ ධීවර සමුපකාර සමිතින් හි පරිපාලනය හා කළමණාකරනය වැඩි දියුණු කිරිමට කටයුතු කරනු ලැබිය. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ මේ වන විටත් සමුපකාර සමිති 11 ක් ඇති අතර උප ව්‍යාපෘතින් යටතේ යාපනේ දිස්ත්‍රික්කයේ සමිති 7 ක්ද පුත්තලම දිස්ත්‍රික්කයේ සමිති 9 ක්ද පිහිටවනු ලැබියි. ක්ෂේත්‍ර පරික්ෂණ මගින් සමිති සඳහා අවශ්‍ය පරිපාලනය හා කළමනාකරණ අවශ්‍යතා හදුනා ගත් අතර ලේකම් ඇතුලු නිලධාරි මණ්ඩලයට පුනක්කරේ ධීවර සමුපකාර සමිතිය සඳහා සහභාගි විමට අවස්ථාව සැලිසිය. මන්ද යත් එම සමිතිය ගම්මට්ටමේ සාර්ථක සමිතියන්ට ඉතා හොද ආදර්ශයක් බැවිනි. එක් එක් සමිතින්හී ලේකම්වරුන් සඳහා මාසයක් පුහුණු කාලයක් සහ මාසික ගෙවීමක් කරනු ලැබිය.

ධීවර කර්මාන්තයේ ආර්ථික හා සාමාජික සාධාරණත්වය වර්ධනය කිරිම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දෙන්නේ එක්සත් ජනපදයේ අන්තර්ජාතික කම්කරු සංගමයේ ආර්ථික දියුණුව ඇති කිරිමේ ව්‍යාපෘතිය හා ජාතික ධීවර ආයතනයේ කකුළු කවුන්සිලය මගිනි.

# ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ තත්ව වාර්තාව

දෙවන නිල නොවන ධීවර සංවර්ධන ව්‍යාපෘති අධ්‍යයනය අන්තර්ජාතික ලෙස පිලිගත් ප්‍රධාන ක්‍රම වේද 3 කට අනුව 2016 ජුනි මස 30 වනදායින් අවසන් විය. ප්‍රතිඵල වලට අනුව,

ධීවර සංවර්ධන ව්‍යාපෘතිය දැනට 3 වන අදියරේ පවතී. එනම් ක්‍රියාත්මක කිරිම හා වැඩි දියුණු කිරිමට උනන්දු කිරිම

MSC (v2.0) ඇගයීම් ක්‍රම වේදයට අනුව ධීවර කර්මාන්තය ලබාගත් ලකුණු ප්‍රමාණය (0.44) ඒ අනුව MSC දිගු කාලින තත්වයන්ට අනුව ධීවර කර්මාන්තය අසාර්ථක බව පෙන්නුම් කරයි.

Seafood Watch මගින් නිපදවන මුහුදු සත්ව ආහාර අධික්ෂණය (v2.0) නිර්ණායකයන්ට අනුව ලබාගත් ලකුණු ප්‍රමාණය 2.11 වන අතර ඒ අනුවද ධීවර කර්මාන්තය අසාර්ථක බව පෙන්නුම් කරයි.

අප්‍රේල් මස දී තැප්‍රොබේන් සීෆුඩ් ගෘප් (පුද්ගලික සමාගම) ධීවර සංවර්ධන ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ වූ ප්‍රථම මුහුදු ආහාර නිෂ්පාදකයන් ලෙස සැලකේ. ඔවුන් විසින් ධීවර සංවර්ධන ව්‍යාපෘතියට ආධාර ලබාදිම සඳහා තව දුරටත් නිර්ණායකයන් ගොඩ නගන අතර 2013 සිට ධීවර ව්‍යාපෘතිය සඳහා 43% තම ආධාර ලබා දී ඇත්තේ ඔවුන් විසිනි. ජුනි මාසයේ දී ෆ්‍රෙෂ් කැච් (පුද්ගලික) සමාගම ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන මුහුදු ආහාර නිෂ්පාදන සාමාජිකයින් බවට පත් විය.

ඉහත සඳහන් ශ්‍රී ලංකාවේ නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තයේ සංවර්ධනයන් සිදු කිරිම සඳහා ජාතික ධීවර ආයතනයේ කකුළු සංගමයේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය, ආර්ථික තත්වය දේශිය බලගැන්වීම තුලින් නගා සිටුවීමේ ව්‍යාපෘතිය, ආසියා පදනම, ශාන්ත මොනිකා මත්ස්‍ය ආහාර, චිකන් ඔෆ් ද සී සහ ෆිෂ්වයිස් සමාගම මගින් ලබා දුන් මූල්‍යමය ආධාර මනා පිටුවහලක් විය. එම නිසා ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ සියලුම සාමාජිකයන්, එම සමාගම් හා එහි සේවක මඩුල්ලට නිල් පිහිනුම් කකුළුවෝ ධීවර කර්මාන්තය නගා සිටුවීමට දක්වන දායකත්වය වෙනුවෙන් හද පිරි ස්තුතිය පුද කරමු.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි බසින් පලවන නිල් පිහිනුම් කකුළු තොරතුරු පත්‍රිකාවේ මෘදු පිටපත් ශ්‍රී ලංකා මුහුදු සත්ව ආහාර අපනයනකරුවන්ගේ SEASL (www.seasl.lk) වෙබ් අඩවියෙන් ලබා ගත හැක. වැඩිදුර තොරතුරු සඳහා steve@pelagikos.lk වෙත විද්‍යුත් තැපෑලෙන් සම්බන්ධ විය හැක.